
# අනුරාධපුරයට මා ගිය වන්දනා ගමන

ඉෂිණී යශෝදරා සමරසිංහ



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි

ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන්

ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය, ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

**දෙසැම්බර් පාසල් නිවාඩු කාලය මට විශේෂ වූයේ මම මාගේ පවුලේ නෑදෑයින් සමග අනුරාධපුරයේ වන්දනා ගමනක් ගිය නිසාය. සයුනි, ලකිර, විනුදි, ලෙත්මිණි යන මාගේ පවුලේ සහෝදර සහෝදරයින් මාත් සමග මේ ගමනට සහභාගී වු නිසා මට හරිම සතුටුයි.**

**අපි මහනුවර නගරයෙන් 2024.12.17 දින පිටත් වී එදින රෑ අනුරාධපුර නගරයේ වන්දනා කරුවන් සඳහා නවාතැන් පහසුකම් සපයන නවාතැන්හලක නැවතුණා. අපි බදාදා දින උදේ පාන්දරම ගියේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කිරීමටයි.**



හිමිදිරි සීතල උදයේ රන්වැට අතරින් දිලෙනා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මා දුටුවේ එදාය. අපි කිරි ආහාර, මල් පහන්, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කලා. ජය ශ්‍රී මහා බෝ සමිඳුගේ බෝපත් සුළඟට වැනෙමින් ඉතා දර්ශණීය ලෙස මා දුටුවා. සුමිහිරි වන්දනා ගාථා මට ඇසුණා. දහස් ගණන් වන්දනා කරුවන් සමග අපිත් ගාථා කියමින් ජය ශ්‍රී මහා බෝ සමිඳු වන්දනා කලා.



**පසුව අප ගියේ රුවන්වැලි මහා සෑය වන්දනා කිරීමටයි. මා දුටු ලොකුම සෑය රුවන්වැලි මහා සෑයයි. අහසේ වළාකුළු අතරින් පෙනුණ රුවන්වැලි මහා සෑය හරිම ලස්සනයි.**



රුවන්වැලි සෑය ඉදිරිපසින් ම මා දුටුවේ පහන් පූජා කිරීම සඳහා නිමකර ඇති පහන් වැටයි. අපි පවුලේ සියලු දෙනා සමගින් සෑය ඉදිරිපස ඇති පහන් වැටේ පහන් පත්තු කර සුවඳුම් පූජා කලා.



**ගලින් වසන ලද විශාල සලපතල මළුවක් චෛත්‍ය වටා ඉතාම ලස්සනට ගොඩනගා තිබුණා. මිනිස්සු විශාල පිරිසක් එහි වැඩී වී චෛත්‍ය වන්දනා කලා. භාවනා කරන හාමුදුරු වරු ද මම දුටුවා.**



ඊළඟට මා දුටුවේ රුවන්වැලි මහා සෑය වටා මල් පෙරහැර ගමන් කරන ආකාරයයි. වෙහෙර වැනි විශාල අලංකාර මල් සැරසිලි රැගත් වන්දනා කරුවන් මහා සෑය වටා පෙරහැරේ ගමන් කරනු මම දුටුවා.



රුවන්වැලි මහා සෑය ඊළඟට අලංකාර වූයේ කොඩි පූජාව වෙනුවෙනි.  ඉතා විශාල බෞද්ධ කොඩි රැගත් කොඩි පූජාව සඳහා අපද  වන්දනා කරුවන් සමග එක් වූවා.  කොඩි පූජාවෙන් පසු අලංකාර රුවන්වැලි සෑය මා දුටුවේ මේ ආකාරයටයි.



මා ඊළඟට දුටුවේ හේවිසි කරුවන්, බෙරකරුවන් හා නැටුම්කරුවන් යුත් දර්ශනිය පෙරහැර රුවන්වැලි මහා සෑය වටා ගමන් කරන ආකාරයයි. එය ඉතාම ලස්සන පෙරහැරක් වූ අතර එය දුටු මට මහනුවර නගරයේ ශ්‍රී දළදා මාළිගාවේ ඇසළ පෙරහැර මතක් වූණා.



**රුවන්වැලි සෑය, ජය ශ්‍රී මහා බෝධිය වන්දනා කිරීමෙන් පසු අපි නැවත මහනුවර නගරය බලා ඒමට පිටත් වුණා. විශාල කුඹුරු යායවල් , නෙළුම් , මානෙල් මල් පිපුණු වැව් අමුණු පසු කරමින් පැමිණි සුන්දර අනුරාධපුර නගරය මට කිසිදාක අමතක නොවේ.**



**නිමි.**

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන
තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම්



# ඉශිනි යශෝධරා සමරසිංහ

**<u>කතෘගේ වෙනත් කෘති</u>**

## අපූරු යාලුවෝ

ISBN 978-624-208-359-9